**ආරක්‍ෂක අමාත්‍යංශ සේවා වනිතා ඒකකයේ සභාපතිනිය කුරුණෑගල අභිමන්සලෙහි සංචාරයක**

ආරක්‍ෂක අමාත්‍යංශයිය සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි ශලිනි වෛද්‍යරත්න මැතිනිය අද (සැප් *26*) දින කුරුණෑගල පිහිටි අභිමන්සලෙහි සංචාරයක නිරත විය.

මෙම අභිමංසල මානුෂීය මෙහෙයුමේදී පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ විරෝධාර රණවිරුවන් සඳහා පිහිටුවා ඇති ස්ථානයකි.

වෛද්‍යරත්න මැතිනිය විසින් අභිමන්සලෙහි නේවාසිකව සිටින රණවිරුවන්ගේ සුවදුක් විමසූ අතර ඔවුන් වෙත තෑගී පාර්සල් ලබාදීමටද කටයුතු කලාය. තවද එතුමිය මෙම අභිමන්සලෙහි පරිපාලන නිලධාරින් සමගද නේවාසික රණවිරුවන්ගේ සුභසාධනය පිලිබඳ සාකච්ඡාවක නිරතවිය.